# තේ තතු

පර්යේෂණ ක්ෂේත්‍රයේ 80 වසරක අභිමානය
80 வருட ஆய்வின் சாதனை
80 Years of Research Achievement

THE TEA RESEARCH INSTITUTE OF SRI LANKA
UNITAS SALUS NOSTRA
INCORPORATED
1925

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශනයකි
ISSN - 1391- 6785
2005 ජූලි - දෙසැම්බර්


## තවානේ වියදම් අඩු කරමු - පැළ බක්කිය පාවිච්චි කරමු

හොඳින් අතු සහ මුල් බෙදී නිරෝගීව හා එක සමානව වැඩුණු තේ පැළ ලබා ගැනීම තේ තවාන් පවත්වා ගෙන යන සියල්ලන්ගේ බලාපොරොත්තුවයි. මේ සඳහා තවාන් කටයුතු මුල සිටම ක්‍රමවත්ව පවත්වාගෙන යා යුතුයි. වඩාත්ම සුදුසු මව් පත්‍ර කැබලි තෝරා නොගැනීම නිසාත් අනෙකුත් විශමතාවයන්ගේ බලපෑම නිසාත් තවානේ සිටුවන මව් කොළ වලින් පැළ සෑදෙන විට එක සමාන වැඩීමක් තවාන පුරා හෝ එකම පාත්තියක තුල වත් දක්නට නොලැබෙයි. මෙම තත්වය තවානේ පොහාර යෙදීම වැනි ක්‍රියාවන් සාර්ථකව කරගෙන යාමට අපහසුතා මතු කරයි. එම නිසා සාමාන්‍යයෙන් තවානේ මව් කොළ සිටුවා මාස 4 - 5 කට පමණ පසු පැල වල වර්ධනය අනුව පැළ වෙන් කිරීමක් සිදුකල යුතුයි. එසේ වෙන් කර ගත් පසු පැල වල වර්ධනය අනුව පොහොර යෙදීම, සින්ක් සල්ෆේට් යෙදීම ආදිය තීරණය කර ගැනීමට පහසු වෙයි. මෙවැනි වැඩීමේ අසමාන තත්වයන් මාස 7 - 8 පමණ වයසැති විටද තවානේ දක්නට ලැබෙන අතර පැල වෙන් කිරීම (සයිස් කිරීම) මගින් මේ තත්වය මග හරවා ගෙන තවානේ සියලු පැළ වර්ග වල වැඩීම එක සමාන කර ගැනීමට උත්සාහ කල හැකියි.

පැළ වෙන් කිර්මේ කටයුත්ත (පැලයේ ප්‍රමාණය අනුව තෝරා නැවත ඇසිර්ම) සඳහා තවාන් කරුවන්ට තරමක් අධික වියදමක් දැර්මට සිදු වෙයි. මෙම වියදම අඩු කිර්ම සඳහාත් මෙම අවස්ථාවේදී පැළ වලට



සිදුවන හානිය අවම කර ගැනීම සඳහාත් *පැල බක්කිය* නැමති උපකරණය සාර්ථකව උපයෝගී කොට ගත හැකියි. මෙම උපකරණය සැහැල්ලු, එසේම සවිමත් දැව වලින් නිර්මාණය කර ඇති අතර ඒ සඳහා වැය වන්නේ සුළු මුදලකි.

පැළ වලට හානියක් නොවන අයුරින් පාත්ති වල හරස් අතට තබා ගැනීමට හැකි වීමත්, පහසුවෙන් එහා මෙහා ගෙන යාමට සකස් කර තිබීමත්, පැළ බක්කිය තුල අහල් 5 ක් පළල අහල් 9 ක් උස, පැළ තවාන් මලු 60 - 70 ක් පමණ ප්‍රමාණයක් එක වර තබා ගැනීමට හැකි නිසාත්, තවානේ පැළ මාරු කිරීම සඳහා මෙම උපකරණය බෙහෙවින් උපකාරී වේ. පැළ මාරු කිරීම සඳහා පමණක් නොව පැළ ප්‍රවාහන කටයුතු සඳහාද (තවානේ සිට පැළ ප්‍රවාහනය සඳහා පැමිණෙන රථයකට හෝ තවානේ සිට ක්ෂේත්‍රයට) මෙම උපකරණය ඉතා ප්‍රයෝජනවත් වේ. එක වරකට වැඩි පැළ ප්‍රමාණයක් ගෙන යාමට හැකි වීම සහ ප්‍රවාහනයේදී පැළ වලට සිදුවන අවම හානිය මෙහිදි සැලකිල්ලට ගත යුතු වැදගත් කරුණු වේ.

බක්කියේ පළල අඩි 1.5 අතර දිග අඩි 3 අහල් 9 කි. එහි උස අඩි 2 වන අතර හැඩලයේ දිග අඩි 1 අහල් 6 කි. මෙම උපකරණය භාවිතයෙන්




තවානේ ප්‍රවාහන වියදම අඩකින් පමණ අඩු කර ගත හැකි බව අපගේ අත්දැකීමයි. කරුණු මෙසේ හෙයින් පැළ බක්කිය පාවිච්චි කොට ඔබගේ තවානේ වියදම් අඩු කොට ගැනීමෙන් ඔබට වැඩි ලාභයක් ලබා ගැනීමට හැකිවන අතරම උසස් තත්වයේ පැළ වගාකරුවන්ට ලබා දිමටද අවස්ථාවක් උදාවේ.


ජනක රාජසිංහ